සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
www.sannasa.com
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241after 4pm

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රචා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**Kuma Gamage**
0414 215 280
**email** kuma.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## දෙබිඩි රාජ්‍යය

ශ්‍රී ලංකාව එකවර අන්ත දෙකකට ගමන් කරමින් සිටියි. එක් අතකින් එය විශාල සංවර්ධන ක්‍රියාවලියකට පාත්‍ර වෙමින් තිබෙයි. අනෙක් අතින් සාධාරණ සමාජ ව්‍යුහයක් සඳහා ඇති ඉඩ කඩ ඉතා සීග්‍ර ලෙසින් සෝදා පාල්වට ලක්වෙමින් තිබෙයි.

වත්මනෙහි රටේ සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියාවලිය හෙළාදැකීමට තරම් දේශපාලන කුහක කමක් ඇති කර ගත යුතු නැත. ශ්‍රී ලංකා ඉතිහාසයේ කවර කලෙක වත් නොවූ විරූ ආකාරයේ සංවර්ධනයක් රටේ සිදුවෙමින් පවතියි. ඒ පිළිබඳ ගෞරවය මහින්ද රාජපක්ෂ රජයට ලබා දිය යුතුය. කොමිස් කුට්ටි පිටින් ගිල දමනවායහයි කියනු ලැබුවද මේ සංවර්ධන ක්‍රියාවලිය තුළින් අවසන් වාසිය ලැබෙන්නේ රටේ මහජනතාවටය.

අනෙක් අතින් නීතිය සහ යහපාලනය නමැති සංකල්ප ඉතිහාසයේ කිසිදා නොදුටුවිරූ ආකාරයට විනාශය කරා යමින් තිබෙයි. මේ විනාශය පිළිබඳව පාලකයන් දැනුවත්ව සිටින බවක් නොපෙනෙන්නේ ඒ විනාශය වැළැක්වීමට කිසිදු ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ගන්නට ඔවුන් උත්සාහයක් හෝ දරා නැති බැවින්ය.

ප්‍රාදේශීය මට්ටමේ සිටම දේශපාලුවෝ නීතිය විනාශ කරමින් සිටිති. මහා පරිමාන කාන්තා දූෂණයේ සිට මිනීමැරුම් දක්වා පෙළ ගැසුණ මේ අවනීතිය හමුවේ නීතිය වල්වැදී සිටින සැටි දකින විට ඇතිවන්නේ කළකිරීමකි. චෝගම් සමුළුව නොවන්නට බ්‍රිතාන්‍ය ජාතිකයෙක් අමු අමුවේ මරා දමා ඔහුගේ පෙම්වතිය සමූහ දූෂණයට ලක් කළ පාලකයන්ගේ ගජමිතුරු ප්‍රදේශීය දේශපාලුවා පවා තවමත් යහතින් වැජඹෙන්නට හොඳටම ඉඩ තිබුණි.  රටේ පවතින්නේ පාලකයන්ගේ ගජ මිතුරන්ට රිසි සේ නීතිය කැඩිය හැකි වාතාවරණයකි. ඒසේ නොවේ නම් වරෙන්තු පිට සිටින සුධර්මන් රදලියගොඩ වැන්නවුන් ප්‍රසිද්ධියේ රජයේ ආයනතයක ඉහළ නිළයක් දරමින් සිටිනේනේත් පාලකයන් හා එක පෙළට පෙනී සිටින්නේත් කෙසේද?

භෞතික සංවර්ධනයසේම රටේ යහපැවැත්ම නීතිය හා යුක්තිය එක ලෙස සංවර්ධනය විය යුතුය. එසේ කළ හැකි නම් මේ රට සුරපුරයක් බවට පත්වනු ඇති අතර පාලකයන් ජනතාවගේ ගරු බුහුමනටද පාත්‍රවනු ඇත. අවාසනාවට පාලකයන් නොකරනුයේද එයමය. එය රටේත් ජනතාවගේත් අවාසනාවමය.

රජය කරවනවුන් එක්කෝ බලයෙන් මත්ව අන්ධව තමා පිටුපසින් සිදුවෙමින් පවතින විනාශය නොදකිමින් සිටිති.  නැත්නම් අසීමිත බලයක් ඇති බැවින් ඕනෑදෙයක් සිදුවුණාට කම් නැතැයි සිටිමින් වීණා වාදනය කරනවා විය හැකිය. දෙකෙන් කොයික වුවද සෑරෙමින් පවතින අගාධය මේ සියල්ලන් වෙනුවෙන් බලා සිටින බව නම් සහතිකය.

සංස්කාරක



# වෘත්තීය සමිති ව්‍යාපාරය හෙවත් බිස්නස් එක

අජිත් පැරකුම් ජයසිංහ

වර්තමාන වෘත්තීය සමිති ව්‍යාපාරය දෙස බැලූවා ම දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ කීපයක් තිබෙනවා.

වෘත්තීය සමිති හා දේශපාලනය අතර ලොකු සම්බන්ධයක් නැහැ. වෘත්තීය සමිති දේශපාලන මැදිහත්වීම්වලට වඩා අවධානය යොමු කර තිබන්නේ වෘත්තීය ඉල්ලීම්වලට විතරයි.

වෘත්තීය සමිති හා සාමාජිකයන් අතරත් ලොකු බැඳීමක් නැහැ. සාමාජිකයෝ වෘත්තීය සමිති කටයුතුවලට එතරම් සම්බන්ධ වන්නේ නැහැ. යම් යම් අවස්ථානුකූලව ඔවුන් වෘත්තීය සමිතියේ නායකත්වය යටතේ කටයුතු කළත්, ප්‍රශ්නය යටපත් වූ පසු ඔවුහු වෘත්තීය සමිතිය අතහැර දමනවා.

සාමාජිකයෝ වෘත්තීය සමිතිවලට පිටින් සිය ප්‍රශ්න සඳහා විසඳුම් සොයනවා.රාජ්‍ය අංශයේ නම්, මේ සඳහා දේශපාලනය බහුලව භාවිතා වෙනවා.

වෘත්තීය සමිති නායකත්වය අත් පත් කරගෙන ඉන්න අය සිය තනතුරු බලය සඳහා උපයෝගී කර ගන්නවා.සමහරු දේශපාලකයන්ගෙන් වාසි ප්‍රයෝජන ගන්නවා. තවත් සමහරු රාජ්‍ය නොවන සංවිධාන ව්‍යාපෘතිවලින් මුදල් උපයනවා.

මේ හේතු නිසා මොවුන් නායකත්වය අතහරින්න අකැමැතියි. ඒ නිසා තනතුරුවල එල්ලී සිටින්නට ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රියාමාර්ගවල යෙදෙනවා.

වෘත්තීය සමිතිවල කටයුතු මේ වන විට ප්‍රධාන වශයෙන් ම සිදු වන්නේ ජනමාධ්‍ය නිවේදන හරහායි. සමිති නායකත්වය හා සාමාජිකත්වය අතර සන්නිවේදනය අවමයි.

මේ වන විට වෘත්තීය සමිති කියන්නේ ව්‍යාපාරයක්. සාමාජික මුදල් සූරා කන තවත් ධනපති සමාගමක්. එය ව්‍යුහය අතින් සමාන වන්නේ රජයට. සාමාජිකයන්ගෙන් සූරා කන මුදල් මේ අය විවිධ කූට ක්‍රමවලින් තමන් අතර බෙදාගෙන සමාගමේ ගිනුම සමතුලනය කරනවා. බැලු බැල්මට ලාභ හෝ පාඩු හෝ නැහැ.

සමිති නිලධාරීහු අන්ත දූෂිතයි. ඒ නිසා ඔවුන් රැකවරණය බලාපොරොත්තුවෙන් ආණ්ඩුව සමග සම්බන්ධ වෙනවා. ඉන් පසුව ඔවුන්ට සිදු වෙනවා, ආණ්ඩුවේ උවමනාවන් ඉටු කරන්න. අද වන විට වෘත්තීය අයිතිවාසිකම් සීමා කර තැබීමේ කාර්යය ආණ්ඩුව වෙනුවෙන් කරන්නේ මේ වෘත්තීය සමිති විසින්මයි. සාමාජිකයන් රවටන්නේ ආණ්ඩුව නොවෙයි. ආ-

4 වන පිටට